# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,949 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 1328 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


91 - B 81019— 352 (2016/01)
D 1 -

# විවිධ දැන්වීම්

## සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

රාජගිරිය, බුත්ගමුව පාර, ෆෙයාර් මවුන්ට් රෙසිඩන්ට්, අංක 24 B හි ''ස්ටර්ලින් ගෲප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්'' පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : එච්. සී. සිවිල් 54/2015/සීඕ.
ස්වභාවය : ණයන් බේරා වසා දැමීම.
කාර්ය පටිපාටිය : සමාගම් පනත
වටිනාකම : රු. 1,143,666.53/-

සහ

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටසේ අධිකරණය මගින් ණයන් බේරා වසා දැමීම පිණිස වූ ඉල්ලීමක කාරණාවේ දී ය.

ට්‍රාන්ස් ස්ක්‍රීන් ඔටෝමේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්,
54/1ඒ, වැව ඉහල පාර,
ජම්බුරලිය, මඩපාත.

......................................... පෙත්සම්කරු.

ඉහත නම් සඳහන් සමාගම වාණිජ මහා අධිකරණය විසින් ණයන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් මඩපාත, ජම්බුරලිය, වැව ඉහල පාර, 54/1ඒ දරන ස්ථානයෙහි ට්‍රාන්ස් ස්ක්‍රීන් ඔටෝමේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් වර්ෂ 2015ක් වූ නොවැම්බර් මස 16 වැනි දින වාණිජ මහා අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2016ක් වූ ජනවාරි මස 21 වැනි දින අධිකරණය ඉදිරියේ දී විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදළව නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදයකයෙක් වේනම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදයකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ :*

ආර්. ඒ. ලංකා ආර්. ධර්මසිරි,
අංක 53, ගොන්ගිතොට,
වත්තල.

*සටහන.*- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් ආර්. ඒ. ලංකා ආර්. ධර්මසිරි වෙත ගෙනැවිත් බාර දිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2015ක් වූ ජනවාරි මස 06 වැනි දින පස්වරු 6.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතු ය. නැතහොත් එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

ආර්. ඒ. ලංකා ආර්. ධර්මසිරි.

අංක 53, ගොන්ගිතොට,
වත්තල.

01-302

## කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද (ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාවේ යොදවමින්) මහාධිකරණයේ දී ය

එහි ලියාපදිංචි ලිපිනය අංක 3B, BEPZ, බියගම, මල්වාන, ශ්‍රී ලංකාවේ හි පිහිටි ග්ලෝබල් බැගේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධ කාරණය පිළිබඳවයි.

නඩු අංකය : මහාධිකරණ (සිවිල්) 56/2015/සීඕ.

සහ

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ඒ ප්‍රකාරව අධිකරණය මගින් ඈවරකිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය පිළිබඳ කාරණය සම්බන්ධවයි.

ස්වභාවය : ණයන් බේරා වසා දැමීම.

රන්ජන් ද සිල්වා,
අංක 27ඒ, කළ්‍යාණි මාවත,
වත්තල.

......................................... පෙත්සම්කරු.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ණයන් බේරා වසා දමනු ලැබීම සඳහා වත්තල, කළ්‍යාණි මාවත, අංක 27ඒ දරන ස්ථානයේ පදිංචි රන්ජන් ද සිල්වා විසින් 2015 නොවැම්බර් මස 16 දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2016 පෙබරවාරි මස 19 දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දයකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දයකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ :*

එෆ්. ජේ. සහ ජී. ද සේරම්,
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

*සටහන.*- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස් ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතු ය. නැතහොත්, තැපෑලෙන් එවිය යුතු ය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළයුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2016 පෙබරවාරි මස 18 දින පස්වරු 6.00ට පෙර බාරදිය යුතු ය. නැතහොත්, තැපැල් මගින් එවන්නේ නම්, ඔවුන්ට (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව තැපැල් මගින් එවිය යුතු ය.

01-422

### ජනකරලිය සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සුනිල් හඳුන්නෙත්ති වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ''ජනකරලිය සංස්කෘතික පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම/ආයතනය සංස්ථාගත කිරීමයි.

1. ස්වභාව ධර්මය සමග සහජීවනයෙන් ජීවත් විය හැකි ස්වභාව ධර්මය වටහා ගැනීමටත්, ස්වභාව ධර්මය සමග යහපත් සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමටත් හැකි වන සමාජයක් නිර්මාණය කිරීමට සහාය වීම,

2. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ ශ්‍රී ලංකාවෙන් පිටත, නාට්‍ය හා රංග කලාව පිළිබඳ වැඩ මුළු, සම්මන්ත්‍රණ, සංවාද, කණ්ඩායම් අධ්‍යයන සහ පොදු දේශන පැවැත්වීම හෝ/සහ ඒවාට අනුග්‍රහය දැක්වීම,

3. පදනමේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා පුද්ගලයින්ට, ප්‍රාථමික මූල සංවිධානවලට සහ රාජ්‍ය ආයතනවලට සහාය දැක්වීම හෝ ඒ සම්බන්ධව කටයුතු කිරීම.

සුනිල් හඳුන්නෙත්ති,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

01-431

### රන්ජන් රාමනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගරු එඩ්වඩ් ගුණසේකර වන මම, ප්‍රකාශ කර දැනුම් දෙන වග නම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 48 යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ''රන්ජන් රාමනායක පදනම සංස්ථාගත කිරීමේ පනත'' පහත සඳහන් සාමාන්‍ය විෂයයන්ගෙන් සමන්විත වේ.

1. සෞඛ්‍ය සම්පන්න සාමකාමී සුව පහසු ජීවිත ගතකිරීම සඳහා සුබසාධන සැපයීම මගින් ඕනෑම අසරණ පුද්ගලයෙකුට/පුද්ගලයන්ට සහාය වීම,

2. අඩු වරප්‍රසාදලාභී හා රැකියා විරහිත පුද්ගලයන් හට සහාය වීම හා අවස්ථාවන් ලබා දීම තුළින් අදාළ ආයතනවලට සහාය දැක්වීම,

3. දිළිඳු පවුල් සඳහා අවශ්‍ය ඉඩම්, නිවාස හා පාසල් අධ්‍යාපන අවස්ථාවන් සහ පහසුකම් ලබාදීම තුළින් අදාළ ආයතනවලට සහාය දැක්වීම,

සහ වෙනත්.

ගරු එඩ්වඩ් ගුණසේකර,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගම්පහ දිස්ත්‍රික්කය.

01-416

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.